# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | |
|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 412 / 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 |
| දිනය<br>திகதி<br>Date | 09 /03/2024<br>පැය 0730 | | |

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මාරක රිය අනතුරක් - මිහින්තලය පොලිස් වසම.**

2024.03.08 වන දින අළුයම් කාලයේ මිහින්තලය පොලිස් වසමේ රඹෑව ප්‍රදේශයේදී රඹෑව දෙස සිට අනුරාධපුර දෙසට ධාවනය වූ කැබ් රථයක මාර්ගයේ ගමන් කරමින් සිටි ගැහැණු ළමයින් දෙදෙනෙකුගේ හා පිරිමි ළමුන් තිදෙනෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. ඉන් බරපතල තුවාල ලබා සිටි පිරිමි ළමුන් තිදෙනා රඹෑව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත. තුවාල ලැබූ ගැහැණු ළමුන් දෙදෙනා අනුරාධපුර රෝහලේ ප්‍රතිකාර ලබයි.

**මරණකරුවන් අවුරුදු 16, 19 හා 21 වයස් වල පසුවන රඹෑව හා පිහිඹියගොල්ලෑව ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මෘත ශරීරයන් රඹෑව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. මරණකරුවන් රඹෑව ප්‍රදේශයේ පැවති සංගීත ප්‍රසංගයක් නැරඹීමට ගොස් නැවත නිවෙස් බලා යමින් සිටියදී මෙම අනතුර සිදුව ඇති බවට අනාවරණය වී ඇත. අනතුරට සම්බන්ධ කැබ් රථයේ රියදුරු අනතුරින් පසු පලාගොස් ඇති අතර, අත්අඩංගුවට ගැනීම සඳහා මිහින්තලය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කොළඹ අපරාධ කොට්ඨාසය.**

2024.03.08 වන දින දහවල් කාලයේදී ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ තොටුපල පාර ප්‍රදේශයේදී කොළඹ අපරාධ කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 13 මිලිග්‍රෑම් 570 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවකු අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 28 ක් වන මට්ටක්කුලිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කොළඹ අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. දේපල සොරකමකට සම්බන්ධ සැකකරුවන් 07 දෙනෙකු අත්අඩංගුවට - අතුරුගිරිය පොලිස් ස්ථානය.**

අතුරුගිරිය පොලිස් ස්ථානයට වාර්ථා වූ නිවසක් බිඳ රුපියල් 1335560/=ක් වටිනා දේපල සොරකම් කිරීමේ අපරාධයක් සම්බන්ධයෙන් අතුරුගිරිය පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් විමර්ශනයක් ආරම්භ කර ඇත. සිදු කරන ලද විමර්ශනයේදී 2024.03.08 වන දින උදෑසන කාලයේදී අතුරුගිරිය පොලිස් වසමේදී අපරාධයට සම්බන්ධ සැකකරුවන් හත් දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත. ඉන් සැකකරුවන් තිදෙනෙකු සන්තකයේ තිබී හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 400ක්, හෙරොයින් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 100ක්, හෙරොයින් ග්‍රෑම් 07 මිලිග්‍රෑම් 900ක්ද සොයා ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 19ත් 45ත් අතර වයස් වල පසුවන හෝකන්දර හා මාලඹේ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

සැකකරුවන්ගෙන් සිදු කරන ලද ප්‍රශ්න කිරීමේදී සොරකම් කරන ලද ශීතකරණයක්, රෙදි සොදන යන්ත්‍ර 01ක්, අවන් 01ක්, රූපවාහිනී යන්ත්‍ර 01ක්, රයිස් කුකර් 01ක්, බිත්ති ඔරලෝසු 04ක්, බඳුන් 08ක්, මහන මැෂින් 01ක්, පිත්තල පහනක්, විදුලි පංකා 02ක්, ගෑස් සිලින්ඩරයක් හා විසිතුරු උපකරණ කිහිපයක් සොයා ගෙන ඇත.

මෙම සැකකරුවන් අතරින් දෙදෙනෙකුට කඩුවෙල මහේස්ත්‍රාත් අධිකරණය මගින් නිකුත් කර තිබූ වරෙන්තු 02කට අවශ්‍ය කර සිටි පුද්ගලයින් දෙදෙනෙකු බවටත් අනාවරණය වි ඇත.

අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**